# ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව
# (SLCARP)
## කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය

# පුරප්පාඩු

ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ පහත සඳහන් රැකියා කාණ්ඩ සඳහා සුදුසුකම් ලත් පුද්ගලයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. (සියලුම ඇබෑර්තු කොළඹ ප්‍රධාන කාර්යාලයේ පවතී)

## 01. ජ්‍යෙෂ්ඨ විද්‍යාඥ (HM 1-1) (ඇබෑර්තු සංඛ්‍යාව - 01)

**සුදුසුකම් :**

**බාහිර :**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක විද්‍යාව හෝ කෘෂිකර්මය පිළිබඳ ප්‍රථම උපාධියක් සහ අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි සුදුසුකමක් (Masters') සමග සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 15 ක පළපුරුද්ද.

හෝ

අදාළ ක්ෂේත්‍රයේ ආචාර්ය උපාධියක් (Ph.D.) සහ ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරියෙකු ලෙස අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක්.

**අභ්‍යන්තර :**

සුදුසු විෂය සංකලනයක් සහිත විද්‍යාව හෝ කෘෂිකර්මය පිළිබඳ උපාධියක් සහ අදාළ ක්ෂේත්‍රයේ වසර 02 ක පශ්චාත්උපාධි පර්යේෂණ උපාධියක්

සහ

අදාළ ක්ෂේත්‍රයේ ආචාර්ය උපාධියක් (Ph.D.) සහ SLCARP ආයතනයේ ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරියෙකු ලෙස අවම වශයෙන් වසර හතරක (04) සතුටුදායක සේවා කාලයක්

හෝ

ජ්‍යෙෂ්ඨ අධ්‍යයන සහ පර්යේෂණ කාණ්ඩයේ "**ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී**" තනතුරක අවම වශයෙන් වසර අටක (08) සතුටුදායක සේවා කාලයක්.

**සටහන :** අදාළ විෂය ක්ෂේත්‍රයට අදාළ පර්යේෂණ ප්‍රකාශන අතිරේක සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

**සේවක ගණයට අදාළ වැටුප් කේතය සහ මාසික වැටුප් පරිමාණය**

- HM 1-1-2025 [රු. 140,640 - 15x4,100 - රු. 202,140] (කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 01/2025 චක්‍රලේඛය මත පදනම්ව)

**වයස :** අවුරුදු 35 ට නොඅඩු සහ අවුරුදු 50 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අපේක්ෂකයින් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

## 02. පර්යේෂණ නිලධාරී - (AR-1) (ඇබෑර්තු සංඛ්‍යාව - 01)

**සුදුසුකම් :**

**බාහිර :**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක සුදුසු විෂය සංකලනයක් සහිත විද්‍යාව හෝ කෘෂිකර්මය පිළිබඳ පළමු පන්තියේ හෝ දෙවන පන්තියේ ඉහළ සාමාර්ථයක් සහිත වසර හතරක විශේෂ උපාධියක්

හෝ

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක, සුදුසු විෂය සංකලනයක් සහිත විද්‍යාව හෝ කෘෂිකර්මය පිළිබඳ දෙවන පන්තියේ පහළ සාමාර්ථයක් සහිත වසර හතරක විශේෂ උපාධියක් සහ අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක පශ්චාත් උපාධි පර්යේෂණ උපාධියක්

හෝ

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක, සුදුසු විෂය සංකලනයක් සහිත විද්‍යාව හෝ කෘෂිකර්මය පිළිබඳ උපාධියක් සහ අදාළ ක්ෂේත්‍රයේ වසර දෙකක (02) පශ්චාත් උපාධි පර්යේෂණ උපාධියක්.

**සේවක ගණයට අදාළ වැටුප් කේතය සහ මාසික වැටුප් පරිමාණය**

- AR 1-2025 : රු. [91,650 – 10 x 2,480 - 15 x 3,450 - රු. 168,200.] (කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 01/2025 චක්‍රලේඛය මත පදනම්ව).

**වයස :** වයස අවුරුදු විසිපහට (25) නොඅඩු සහ අවුරුදු හතළිස් පහට (45) නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අපේක්ෂකයින් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

## 03. කළමනාකරණ සහකාර - (MA 1-1) (ඇබෑර්තු සංඛ්‍යාව - 06)

**සුදුසුකම් (සාමාන්‍ය) :**

**බාහිර අපේක්ෂකයින් :**

**අධ්‍යාපනික :**

අ). අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන්,

i. සිංහල/දෙමළ

ii. ඉංග්‍රීසි භාෂාව

iii. ගණිතය

ඇතුළුව විෂයන් හතරකට සම්මාන සාමාර්ථ සහිතව එකම වරකදී විෂයන් හයකින් සමත්වීම.

ආ ). අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) විෂයන් තුනකින් සමත්වීම.

**අභ්‍යන්තර අපේක්ෂකයින් :**

පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති ප්‍රාථමික මට්ටමේ – පුහුණු සහ ප්‍රාථමික මට්ටමේ – නොපුහුණු යන ශ්‍රේණිවල සේවකයින්ට අයදුම් කිරීමට සුදුසුකම් ඇත.

**අධ්‍යාපනික :**

අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන්, i. සිංහල/දෙමළ, ii. ඉංග්‍රීසි භාෂාව, iii. ගණිතය ඇතුළුව විෂයන් හතරකට සම්මාන සාමාර්ථ සහිතව විෂයන් හයකින් සමත් විය යුතුය.

**වෙනත් :**

ඉහත සඳහන් සේවක ගණයට අයත් ස්ථිර තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**සටහන :** ස්ථිර තනතුරකට පත් කිරීමට පෙර ලබා ඇති සේවා කාලය හෝ ස්ථිර පදනම මත පත් කිරීම සඳහා පූර්ව අවශ්‍යතාවක් ලෙස සම්පූර්ණ කළ යුතු පුහුණු කාලසීමාවන් ඉහත සඳහන් කළ වසර පහක සේවා කාලය ගණනය කිරීමේදී සැලකිල්ලට නොගත යුතුය. තවද, අනියම් හෝ තාවකාලික පදනම මත ඉටු කරන ලද කිසිදු සේවා කාලයක්ද මේ සඳහා ගණනය නොකළ යුතුය

**සේවක ගණයට අදාළ වැටුප් කේතය සහ මාසික වැටුප් පරිමාණය**

- MA 1-1-2025 [රු. 46,220 - 10 x 540 - 7 x 630 – 4 x 890 - 20 x 1,190 - රු. 168,200].

**වයස :** වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අපේක්ෂකයින් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ

**අයදුම් කරන ආකාරය :**

සභාපති, ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව, අංක 114/9, විජේරාම මාවත, කොළඹ 07 වෙත යොමු කරන ලද ආවරණ ලිපියක් සමග ජීව දත්ත පත්‍රිකාව (CV) සහ අධ්‍යාපනික, වෘත්තීය සුදුසුකම් සහ සේවා පළපුරුද්ද සනාථ කරන සහතික හි සහතික කළ පිටපත් සමග ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් සහ ලිපින ඇතුළත් අයදුම්පත් 2026.05.27 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ SLCARP වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

රාජ්‍ය අංශයේ සේවකයින් තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් මගින් (නිසි ක්‍රමවේදයට අනුව) යොමු කළ යුතු අතර, අයදුම්කරු අදාළ තනතුර සඳහා තේරී පත්වුවහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකිද යන්න එහි පැහැදිලිව සඳහන් කළ යුතුය

අයදුම් කරනු ලබන තනතුර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ සඳහන් කළ යුතුය. ඉහත අවශ්‍යතාවලට අනුකූල නොවන අයදුම්පත්, අසම්පූර්ණ අයදුම්පත් සහ අවසාන දිනට පසුව ලියාපදිංචි තැපෑලෙන් එවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**සභාපති,**
**ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව,**
**අංක 114/9, විජේරාම මාවත, කොළඹ 07.**